# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,325 - 2023 මාර්තු මස 31 වැනි සිකුරාදා - 2023.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 598 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |


සැ. යු. - (i) දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) 2023 මාර්තු මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත 2023 මාර්තු මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 අප්‍රේල් මස 21 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 අප්‍රේල් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


595 - B 82441 — 5,403 (2023/03)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල 'ක්වාසි' තනතුරු සඳහා ක්වාසි විනිසුරුවරුන් පත් කිරීම - 2023

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින් හට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලීම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥවරයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරු ඉස්ලාම් ආගම පිළිබඳ මනා දැනුමක් ඇති, වයස අවුරුදු 40ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත හා ඉස්ලාම් නීතිය පිළිබඳ විශේෂිත වූ මනා දැනුමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙකු විය යුතුය.

තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.

ක්වාසිවරයෙකු තමා පත් කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිර ව පදිංචි වී සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

ක්වාසිවරයා හට මසකට රුපියල් 7,500 ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 6,250 ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''ක්වාසි'' යනුවෙන් සඳහන් කොට **2023 අප්‍රේල් මස 24** වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

ආනන්දි කනගරත්නම්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2023 මාර්තු මස 24 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 573,
කොළඹ 12.

උපලේඛනය

| | *ක්සාවි අධිකරණය* | *ක්වාසි අධිකරණ කලාපය* |
|---|---|---|
| 01 | බේරුවල | කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය. |
| 02 | බෝරා ප්‍රජාව | ශ්‍රී ලංකා බෝරා ප්‍රජාව |
| 03 | කොළඹ උතුර | කොළඹ අධිකරණ කළාපයට අයත් කොටුව, පිටකොටුව, මරදාන, සුදුවැල්ල, බොරැල්ල, කුප්පියාවත්ත, දෙමටගොඩ, මාලිගාකන්ද, මාදම්පිටිය, මෝදර, මට්ටක්කුලිය, කොටා වීදිය, කොලොන්නාව, අංගොඩ, වැල්ලම්පිටිය යන අධිකරණ බල ප්‍රදේශ. |
| 04 | කොළඹ දකුණ | කොළඹ අධිකරණ කළාපයට අයත් කොම්පඤ්ඤ වීදිය, කුරුඳුවත්ත, කොල්ලුපිටිය, බම්බලපිටිය, හැව්ලොක් ටවුම, නාරාහේන්පිට, වැල්ලවත්ත සහ කිරුළපන යන අධිකරණ බල ප්‍රදේශ. |
| 05 | හැටන් | නුවරඑළිය දිස්ත්‍රික්කයේ හැටන් අධිකරණ කලාපය. |
| 06 | හොරණ | කළුතර දිස්ත්‍රික්කයේ හොරණ අධිකරණ කලාපය |
| 07 | මාතර | මාතර දිස්ත්‍රික්කයේ මාතර අධිකරණ කලාපය |
| 08 | පානදුර | කළුතර දිස්ත්‍රික්කයේ පානදුර අධිකරණ කලාපය |
| 09 | වවුනියා | වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියා අධිකරණ කලාපය |
| 10 | යාපනය | යාපනය දිස්ත්‍රික්කයේ යාපනය, පේදුරුතුඩුව හා කයිට්ස් අධිකරණ කලාපය. |

*1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය යටතේ) ක්වාසිවරයෙකු පත් කිරීමේ ඉල්ලුම් පත්‍රය*

ක්වාසි බල ප්‍රදේශය :

1. මුලකුරු සමඟ නම :

උදා. : අබ්දුර් රහ්මාන් එම්. අයි.

2. සම්පූර්ණ නම :

උදා. මුහම්මදු ඉස්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය :

| ව | ව | ව | ව | මා | මා | දි | දි |
|---|---|---|---|---|---|---|---|

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා. හැ. ප. අංකය :

10. දුරකථන අංකය :

11. අධ්‍යාපන සුදුසුකම් :

1. ..........
2. ..........
3. ..........
4. ..........
5. ..........

12. වෘත්තීය සුදුසුකම් :

1. ..........
2. ..........
3. ..........
4. ..........
5. ..........

13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :

14. ඉස්ලාම් නීතිය පිළිබඳ දැනීමක් තිබේ ද ? : | ඔව් | | නැත | |

15. විවාහක ද ? : | ඔව් | | නැත | |

16. භාර්යාව ජීවත්ව සිටී ද ? : | ඔව් | | නැත | |

17. ඉහත දී කරන ලද සහ දැනට කරන රැකියාවන් (දිනත් සමඟ) :

| සිට | දක්වා | රැකියාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

18. ඉල්ලුම්කරු සතු දේපල වටිනාකම : රු.

19. මාසික ආදායම : රු.

20. කොපමණ ණය ගැතිද, ඇතොත් : රු.

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද ? : | ඔව් | | නැත | |

22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද ? : | ඔව් | | නැත | |

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුණේ ද ? තිබේ ද ? : | ඔව් | | නැත | |

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වගකිවයුතු පුද්ගලයන් විය යුතු ය) :

| | |
|---|---|
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |
| දුරකථන අංක : | දුරකථන අංක : |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : |

මෙම අයදුම්පතෙ හි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

——————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :——————.

*සටහන* :
සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

03-943

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ආරක්ෂක අමාත්‍යාංශය

**ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ විධායක සේවා ශ්‍රේණියට අයත් අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර (තාවකාලික) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම**

ආරක්ෂක ආමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ විධායක සේවා ශ්‍රේණියට අයත් අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර සඳහා තාවකාලික පදනම මත පුරප්පාඩු 01ක් පිරවීම සඳහා නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *බඳවා ගැනීමේ ක්‍රමය* :
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2. *අවශ්‍ය සුදුසුකම්* :

(i) *අධ්‍යාපන සුදුසුකම්—*
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන ජාත්‍යන්තර සබඳතා/සාමය හා ගැටුම් නිරාකරණ අධ්‍යයනය/ආරක්ෂක අධ්‍යයනය/බුද්ධි සේවා අධ්‍යයනය/ත්‍රස්තවාදය/සමාජ විද්‍යාව/දේශපාලන විද්‍යාව/නීතිය/ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(ii) *පළපුරුද්ද-*
පර්යේෂණ කටයුතු සම්බන්ධ ව වන ක්ෂේත්‍රයකින් ලබාගත් කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 06 ක පළපුරුද්ද සහිත වීම.

(iii) කායික සුදුසුකම්-
ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ත්, තනතුරෙ හි රාජකාරි ඉටු කිරීමට ත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) වෙනත් සුදුසුකම්-
(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර තාවකාලිකය.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

4. *වයස් සීමාව* :
ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස අවු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

5. *වැටුප් පරිමාණය :*
මෙම තනතුර සඳහා මූලික වැටුප රු. 80,295 + ජීවන වියදම් දීමනාව රු. 7,800 = රු. 88,095 මාසික දීමනාවක් හිමි ය. (ඔබට වැටුප් ගෙවනු ලබන්නේ 2016.04.25 දිනැති සහ 2016.10.21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/216 හා 02/2016 (1) හි විධිවිධාන පරිදි වේ.)

6. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

<table>
<tr><th colspan="2">ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ</th><th>ලකුණු බෙදී යන ආකාරය</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td>01.</td><td>අතිරේක අධ්‍යාපන සුදුසුකම් / අතිරේක වෘත්තීය සුදුසුකම්<br><br>(මූලික සුදුසුකම් හා මූලික සුදුසුකම් සඳහා හේතුවන ලද සුදුසුකම් හැර)<br><br>ක්ෂේත්‍රයට අදාළ ව ලබා ගන්නා ලද ආචාර්ය උපාධිය<br>ක්ෂේත්‍රයට අදාළ ව ලබා ගන්නා ලද පශ්චාත් උපාධිය (වසරකට නොඅඩු)<br>ක්ෂේත්‍රයට අදාළ ව ලබා ගන්නා ලද පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br>ක්ෂේත්‍රයට අදාළ ව ලබා ගන්නා ලද උපාධිය<br>ක්ෂේත්‍රයට අදාළ ව ලබා ගන්නා ලද ඩිප්ලෝමාව (වසරකට නොඅඩු)<br>ක්ෂේත්‍රයට අදාළ ව ලබා ගන්නා ලද ඩිප්ලෝමාව (වසරකට අඩු මාස 06කට වැඩි)</td><td>ලකුණු 20<br>ලකුණු 15<br>ලකුණු 12 බැගින්<br>ලකුණු 10 බැගින්<br>ලකුණු 07 බැගින්<br>ලකුණු 05 බැගින්</td><td>ලකුණු 20</td></tr>
<tr><td>02.</td><td>අතිරේක පළපුරුද්ද :<br><br>ක්ෂේත්‍රයට අදාළව ලබාගත් පළපුරුද්ද සඳහා (මූලික සුදුසුකම් සඳහා සලකා බලනු ලබන වසර 06 ක පළපුරුද්දට අමතරව සලකා බලනු ලැබේ.)<br><br>මාස 06ට කට වැඩි හා වසරකට අඩු පළපුරුද්ද සඳහා ලකුණු 02 බැගින්<br>(උපරිම ලකුණු 30ක් පමණක් ලබා දේ.)</td><td>වසරකට ලකුණු 05 බැගින්</td><td>ලකුණු 30</td></tr>
<tr><td>03</td><td>පරිගණක හැකියාව :<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක තොරතුරු තාක්ෂණ ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති උපාධියක් සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු හෝ පැය 1500ක තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>-මාස 06/පැය 720<br>-මාස 03/පැය 360</td><td>ලකුණු 15<br><br>ලකුණු 10<br><br>ලකුණු 07<br>ලකුණු 05</td><td>ලකුණු 20</td></tr>
<tr><td>04</td><td>භාෂා ප්‍රවීණතාව :<br><br>ඉංග්‍රීසි භාෂාව<br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය)</td><td>ලකුණු 15</td><td>ලකුණු 20</td></tr>
</table>

| | *ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ* | *ලකුණු බෙදී යන ආකාරය* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 04 (ඉතිරි) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01කට නොඅඩු හෝ පැය 1500)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06/පැය 720<br>- මාස 03/පැය 360<br>(ඉහල ම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | ලකුණු 10<br><br>ලකුණු 10<br><br><br>ලකුණු 07<br>ලකුණු 05 | |
| | දෙවන බස<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක දෙවන බස පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01කට නොඅඩු හෝ පැය 1500)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක දෙවන බස පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06/පැය 720<br>- මාස 03/පැය 360<br>(ඉහලම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | ලකුණු 05<br><br><br>ලකුණු 04<br>ලකුණු 02 | |
| 05 | *සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය :*<br><br>➢ නායකත්වය<br>➢ ආකල්ප<br>➢ පෞරුෂත්වය<br>➢ සන්නිවේදනය | <br><br>2.5<br>2.5<br>2.5<br>2.5 | 10 |
| | මුළු එකතුව | | 100 |

***සටහන*** - යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලබන සහතිකපත්‍රවල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතිකපත්‍රවලට අදාළ කාල සීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාලසීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතිකපත්‍ර ලකුණු ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

7. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකපත්‍රවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

8. *අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය* :

(i) සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ යන ලිපිනය වෙත **2023.04.21** දිනට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත් දෙවැනි පිටුව අංක 04 සිට 06 දක්වාත් 03 වන පිටුව අංක 07 සිට 08 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ විධායක සේවා ශ්‍රේණියට අයත් අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර (තාවකාලික) සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු හෝ රු. 47,615/-ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

9. *සාවද්‍ය තොරතුරු සැපයීම* :
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල, භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණය වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

2023 මාර්තු මස 23 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ විධායක සේවා ගණයට අයත් අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර (තාවකාලික) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න (සිංහල-2/දෙමළ-3/ඉංග්‍රීසි-4)
**සටහන** :-අයදුම් කරන භාෂා මාධ්‍යය වෙනස් කළ නොහැක.

---

01. 1.1 මුලකුරු සමඟ නම : Mr./Mrs./Miss :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
2.3 දුරකථන අංකය :
ස්ථාවර :————. ජංගම :————.

03. 3.1 ජනවර්ගය ☐ සිංහල - 1 දෙමළ - 2 මුස්ලිම් - 3 වෙනත් - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 ස්ත්‍රී/පුරුෂ භාවය ☐ පුරුෂ - 1 ස්ත්‍රී - 2
(අදාළ කොටුව තුළ අංකය ලියන්න)

3.3 විවාහක/අවිවාහක බව ☐ විවාහක - 1
(අදාළ කොටුව තුළ අංකය ලියන්න) අවිවාහක - 2

3.4 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.5 2023.04.21 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.6 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1.1. ප්‍රථම උපාධිය
(i) උපාධිය බලපැවැත්වෙන දිනය :————.
(ii) විශ්වවිද්‍යාලය/ආයතනය :————.
(iii) උපාධිය :————.

4.1.2. පශ්චාත් උපාධිය
(i) උපාධිය බලපැවැත්වෙන දිනය :————.
(ii) විශ්වවිද්‍යාලය/ආයතනය :————.
(iii) උපාධිය :————.

4.2 තනතුරට අදාළ පළපුරුද්ද :————.

4.3 අතිරේක අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්
(i) ආයතනය :————.
(ii) සුදුසුකම :————.
(iii) සුදුසුකම් බලාත්මක වන දිනය :————.

05. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුවේ ලකුණ (✓) යොදන්න) (ඔව් නම් විස්තර කරන්න)

| නැත | | ඔව් | |
|---|---|---|---|

.......................................................................................................................

06. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සියලුම කොටස් නිවැරදි ව සම්පූර්ණ කර ඇති බවත්, ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වනබව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

07. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු /සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතීඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු හෝ රු. 47,645 කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කළ යුතුය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ........................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය :————.

සම්පූර්ණ නම :————.

තනතුර :————.

දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

08. ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

ඉහත විස්තර සඳහන්.......................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිඳු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව යොදන්න)

03-1271/1

---

**ආරක්ෂක අමාත්‍යාංශය**

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ පර්යේෂණ විශ්ලේෂක තනතුර (තාවකාලික) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම.

ආරක්ෂක ආමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ පර්යේෂණ විශ්ලේෂක තනතුරෙ හි (තාවකාලික) පවතින පුරප්පාඩු 01ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා බඳවා ගනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :*

(i) *අධ්‍යාපන සුදුසුකම්—*
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන ජාත්‍යන්තර සබඳතා/සාමය හා ගැටුම් නිරාකරණ අධ්‍යයනය/ආරක්ෂක අධ්‍යයනය/බුද්ධි සේවා අධ්‍යයනය/ත්‍රස්තවාදය/සමාජ විද්‍යාව/දේශපාලන විද්‍යාව/නීතිය/ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

(ii) *පළපුරුද්ද-*
පර්යේෂණ කටයුතු සම්බන්ධව වන ක්ෂේත්‍රයකින් ලබාගත් අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් සහිත වීම.

(iii) *කායික සුදුසුකම්-*
ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙ හි රාජකාරී ඉටුකිරීමට ත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) *වෙනත් සුදුසුකම්-*
(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. *වයස් සීමාව :*
ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

4. *වැටුප් පරිමාණය :*

මෙම තනතුර සඳහා මූලික වැටුප රු. 53,150 + ජීවන වියදම් දීමනාව රු. 7,800 - රු. 60,950 මාසික දීමනාවක් හිමි ය. (ඔබට වැටුප් ගෙවනු ලබන්නේ 2016.04.25 දිනැති සහ 2016.10.21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/216 හා 02/2016 (1) හි විධිවිධාන පරිදි වේ.)

5. යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ. :

| *ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ* | | *ලකුණු බෙදී යන ආකාරය* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | *අතිරේක අධ්‍යාපන* / වෘත්තීය සුදුසුකම්<br><br>අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>(මූලික සුදුසුකම් හා මූලික සුදුසුකම් සඳහා හේතු වන ලද සුදුසුකම් හැර)<br><br>ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා ලද පශ්චාත් උපාධිය/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br>ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා ලද උසස් ඩිප්ලෝමාව<br>ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා ලද ඩිප්ලෝමා<br>ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා ලද සහතිකපත්‍ර පාඨමාලා<br><br>අතිරේක වෘත්තීය සුදුසුකම්<br>පිළිගත් පර්යේෂණ ජර්නල්වල පර්යේෂණ පත්‍ර ප්‍රසිද්ධකර තිබීම<br>පිළිගත් විද්වත් සංගම්වල සාමාජිකත්වය | ලකුණු 10<br>ලකුණු 07<br>ලකුණු 05<br>ලකුණු 03<br><br>ලකුණු 10<br>ලකුණු 05 | ලකුණු 10<br><br>ලකුණු 10 |
| 02. | *අතිරේක පළපුරුද්ද :*<br><br>ක්ෂේත්‍රයට අදාළව ලබාගත් පළපුරුද්ද සඳහා (මූලික සුදුසුකම් සඳහා සලකා බලනු ලබන වසර 02 ක පළපුරුද්දට අමතරව සලකා බලනු ලැබේ. | වසරකට ලකුණු 05 බැගින් (උපරිම වසර 7ක් සඳහා | ලකුණු 35 |
| 03 | *පරිගණක හැකියාව*<br><br>වාචික ප්‍රශ්න 5 (ප්‍රායෝගික දැනුම) | ප්‍රශ්නයකට ලකුණු 4 බැගින් | ලකුණු 20 |
| 04 | *භාෂා ප්‍රවීණතාව :*<br><br>ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය සළකා බලනු ලැබේ.<br><br>ලිඛිත පරීක්ෂණය (විනාඩි 30)<br>වාචික ප්‍රශ්න/ප්‍රායෝගික දැනුම | ලකුණු 10<br>ලකුණු 10 | ලකුණු 20 |

| ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ | | ලකුණු බෙදී යන ආකාරය | උපරිම ලකුණු |
|---|---|---|---|
| 05 | *සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා :*<br>➢ කුසලතාවය<br>➢ නායකත්වය<br>➢ ආකල්ප<br>➢ පෞරුෂත්වය<br>➢ සන්නිවේදනය | <br>1<br>1<br>1<br>1<br>1 | 05 |
| | මුළු එකතුව | | 100 |

6. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7. *අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :*

(i) සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2023.04.21** දිනට හෝ එදිනට ප්‍රථම, ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 04 දක්වාත් දෙවැනි පිටුව අංක 05 සිට 07 දක්වාත් වන ආකාරයෙන් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ ''පර්යේෂණ විශ්ලේෂක තනතුර (තාවකාලික) සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු හෝ රු. 47,615/-ක මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිඳු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

8. *සාවද්‍ය තොරතුරු සැපයීම :*
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

10. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

2023 මාර්තු මස 23 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ පර්යේෂණ විශ්ලේෂක තනතුර (තාවකාලික) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

01. 1.1 මුලකුරු සමග නම : Mr./Mrs./Miss :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
2.3 දුරකතන අංකය :

ස්ථාවර :————. ජංගම :————.

03. 3.1 ජනවර්ගය [ ] සිංහල - 1 දෙමළ - 2 මුස්ලිම් - 3 වෙනත් - 4
(අදාළ කොටුව තුළ අංකය ලියන්න)

3.2 ස්ත්‍රී/පුරුෂ භාවය [ ] පුරුෂ - 1 ස්ත්‍රී - 2
(අදාළ කොටුව තුළ ලියන්න)

3.3 විවාහක/අවිවාහක බව

| විවාහක | | අවිවාහක | |
|---|---|---|---|

(අදාළ ස්ථානයේ ✓ ලකුණ යොදන්න)

3.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

3.5 උපන් දිනය : වර්ෂය :————, මාසය :————, දිනය :————.

3.6 2023.04.21 දිනට වයස : අවුරුදු :————, මාස :————, දින :————.

04. අධ්‍යාපන සුදුසුකම් :
4.1.1. ප්‍රථම උපාධිය
(i) උපාධිය බලපැවැත්වෙන දිනය :————.
(ii) විශ්වවිද්‍යාලය/ආයතනය :————.
(iii) උපාධිය :————.

4.1.2. පශ්චාත් උපාධිය
(i) උපාධිය බලපැවැත්වෙන දිනය :————.
(ii) විශ්වවිද්‍යාලය/ආයතනය :————.
(iii) උපාධිය :————.

4.2 තනතුරට අදාළ පළපුරුද්ද :————.
4.3 අතිරේක අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :————.
(i) ආයතනය :————.
(ii) සුදුසුකම :————.
(iii) සුදුසුකම් බලාත්මක වන දිනය :————.

05. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුවේ ලකුණ (✓) යොදන්න) (ඔව් නම් විස්තර කරන්න)

| නැත | | ඔව් | |
|---|---|---|---|

06. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වනබව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

07. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු /සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතීඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ රු. 47,615 ක වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කළ යුතුය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්න හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරීයාගේ අත්සන.

දිනය :————.
සම්පූර්ණ නම :————.
තනතුර :————.
දිනය :————.

(නිල මුද්‍රාව යොදන්න)

03-1271/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.